වැලිමඩ ප්‍රාදේශීය සභාව
බදුල්ල දිස්ත්‍රික්කය
----------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වැලිමඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පතු පොලි රු.1,740,031 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයට අදාළ කර්මාන්ත ණයහිමියන් සඳහා රු.620,270 ක් වෙන් කර නොතිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය රු.13,873,443 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල රු.13,884,432 ක් ලෙස දක්වා තිබීම නිසා රු.10,989 ක වෙනසක් පැවතුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු ගබඩා තොගය රු.97,564 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1.4 <u>අනුකූල නොවීම්</u>

<u>නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්</u>

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ)1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය | සමාලෝචිත වර්ෂයේ කඩකුලී හා සතිපොල ගාස්තු ලෙස අයවිය යුතු රු1,052,119 ක මුදල හිඟව පවතින අතර, ඒවා අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පනතේ සඳහන් කර ඇති වගන්තිවල විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නීති,රීති, රෙගුලාසි අනුගමනය කරමි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා(මුල්‍ය හා පරිපාලන)රීති සංග්‍රහයේ රීති 179 | කුලිය මත ලබාදුන් වෙළඳසැල් 14 ක් සම්බන්ධව ගිවිසුම්ගතවී නොතිබුණි. | රීති අනුව කටයුතු කළ යුතුවේ. | නීති,රීති, රෙගුලාසි අනුගමනය කරමි. |
| (ඇ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය | වර්ෂ පහකට වරක් දේපල හා බදු කුලී තක්සේරු කළයුතු වුවද, 2010 වර්ෂයෙන් පසුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනය වනවිටත් සභාව සතු වෙළඳසැල් 35 ක් තක්සේරු කර නොතිබුණි. | චක්‍ර ලේඛය අනුව කටයුතු කළ යුතුවේ. | නීති, රීති, රෙගුලාසි අනුගමනය කරමි. |
| (ඈ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | ප්‍රාදේශීය සභාව සතු වාහන 09 ක ඉන්ධන දහනය පරික්ෂා කර නොතිබුණි. | නියමිත කාලය තුළදී ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකළ යුතුවේ. | නීති,රීති, රෙගුලාසි අනුගමනය කරමින් ලේඛන නඩත්තු කරමි. |

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.24,772,946 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.35,483,499 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i | වරිපනම් හා බදු | 5,270,774 | 5,330,777 | 4,179,411 | 5,098,622 | 5,268,770 | 5,386,379 | 4,107,924 | 5,273,711 |
| ii | කුලී | 3,282,865 | 3,282,865 | 3,479,898 | 3,588,386 | 3,282,865 | 2,866,027 | 2,282,566 | 3,266,613 |
| iii | බලපත්‍ර ගාස්තු | 12,827,890 | 12,492,061 | 11,986,012 | 12,232,014 | 7,047,100 | 7,159,939 | 6,925,273 | 7,197,733 |
| iv | වෙනත් ආදායම් | - | 34,412,765 | - | - | - | - | - | 44,379,003 |
| | එකතුව | 21,381,529 | 55,518,468 | 19,645,321 | 20,919,022 | 15,598,735 | 15,412,345 | 13,315,763 | 60,117,060 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු.55,518,468 ක් වූ මුළු ආදායමින් වර්ෂය අවසාන වන විට රු. 20,919,022 ක් අයකර නොතිබුණු අතර, එය මුළු බිල් කළ ආදායමෙන් සියයට 38 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | ඉදිරියේදී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | වසරකට අධික කාලයක සිට පැවත එන හිඟහිටි වරිපනම්, සහ හිඟ හිටි වෙනත් ආදායම් එකතුව රු.43,263,658 ක් සමාලෝචිත වර්ෂයේදීද අය කරගෙන නොතිබුණි. | ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) උසාවි දඩ | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ උසාවි දඩ රු.21,310,525 ක් විය. | හිඟ උසාවි දඩ මුදල් අයකර ගත යුතුවේ. | ඉදිරියේදී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

(ආ) මුද්දර ගාස්තු

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ මුද්දර ගාස්තුව රු.5,571,595 ක් විය. | හිඟ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | ඉදිරියේදී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කරමි. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ලගා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | ඉදිරියේදී තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක අනුව කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැලිමඩ ප්‍රාදේශීය සභාවට අයත් වැලිමඩ නගරයේ පිහිටි ගොඩනැගිල්ලක් රාජ්‍ය බැංකුවක ශාඛාවක් පවත්වාගෙනයාම සඳහා මසකට රු.150,000 ක කුලියකට එම බැංකුව සමඟ වර්ෂ 05 ක කාලයක් සඳහා ගිවිසුමකට එළඹ තිබුණි. තක්සේරු දෙපාර්තමේන්තුව මාසික කුලිය තක්සේරු කර ඇත්තේ අවුරුදු 3 ක කාලයකට බැවින්, ඉතිරි අවුරුදු 02 ක සඳහා කුලිය වෙනස් කිරීමට තිබුණු අවස්ථාව මඟ හැරී තිබුණි. | සභාවට වාසිදායක ලෙස බාහිර පාර්ශවය සමඟ ගිවිසුම් වලට එළඹිය යුතුවේ. | ගිවිසුම සංශෝධනය කිරීමට දන්වා යවා ඇත. |

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
|---|---|---|---|
| (ආ) | වසරකට අධික කාලයක සිට පැවත එන ගෙවිය යුතු වියදම් ණය හිමියෝ රු.33,177,204 ක් සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ.අ | ප්‍රවර්තන වර්ෂයේදී ගෙවිය යුතු ශේෂ නිරවුල් කරමි. |

3.3 <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
|---|---|---|
| 1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ II කොටස 10(i) (ආ) (උ) අනුව පරිසරයට හානිවන ද්‍රව්‍ය හා ඝන අපද්‍රව්‍ය ප්‍රමාණවත් පාලනයකින් යුක්තව බැහැර කළයුතු වුවද, වෙන්කර ලබා නොගන්නා කසළ අක්‍රමවත්ව බැහැර කිරීම සිදු කරයි. | කසළ ක්‍රමවත්ව බැහැර කළ යුතුවේ. | පරිසර නීතිය අනුව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කටයුතු හා කසළ ඉවත් කිරීමට දැනට වැඩ පිළිවෙලක් සකස් කර ඇත. |

3.4 <u>ප්‍රසම්පාදනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කරමින් පවතී. |

3.5 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ සිට ස්ථාන මාරුගිය හා සේවය හැර ගිය නිලධාරින් 13 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු233,886 ක හිඟ ණය අය කරගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ අදාල පුද්ගලයන්ගෙන් අයකරගත යුතුවේ. | නීති,රීති රෙගුලාසි අනුගමනය කරමින් ලේඛන නඩත්තු කරමි. |

4. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

4.1 <u>අභ්‍යන්තර විගණනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | ඉදිරියේදී අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමට කටයුතු කරමි. |

4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවෙහි 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/ 2009 (01) දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ පිළිබඳ චක්‍රලේඛය අනුව කාර්තුවකට වරක්වත් විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු 02 ක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | ඉදිරියේදී කාර්තුවකට එක බැගින් විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට කටයුතු කරමි. |